**යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ

වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය
  ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී සහ ඉකුත් වර්ෂයන් හි දී ගොඩනැගිලි ඉදිකිරීම හා ඉඩම් සංවර්ධනය කිරීම වෙනුවෙන් දරා තිබුණු රු.6,435,964 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන පරිභෝජනය කරන ලද රු.668,400 ක පුනරාවර්තන වියදමට අදාළ භාණ්ඩ කාර්යාල උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සභාව විසින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වීථි පහන් කණු වෙනුවෙන් දරන ලද රු.742,608 ක වියදම ඉඩම් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | ඉදිරියේදි නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු රු.99,000 ක් වටිනා යන්ත්‍රෝපකරණ සහ රු.112,500 ක් වටිනා ගෘහ උපකරණ ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ නිම කර තිබුණ ද, රු.1,642,252 ක ප්‍රතිපාදන ලැබී නොතිබුණු කර්මාන්ත 05 ක් සඳහා ණයගැති ප්‍රතිපාදන සලසා නොතිබුණි. | - එම - | - එම - |
| (ඊ) | ඉකුත් වර්ෂයේ දී ගං වතුරෙන් හානි සඳහා රු.511,320 ක වියදම යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කර තිබුණු අතර, එම මුදල ආදායමට නොගෙන ගෙවිය යුතු තැන්පතු ලෙස ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලේ රු.662,925 ක ණය වාරික ගෙවීම ආදායම් වියදම් ගිණුමට හර කර තිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඖ) | සමාලෝචිත වර්ෂයේ දී සහ ඉකුත් වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු රු.663,750 ක ජීව වත්කම් තොගය සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් ගතකර නොතිබුණි. | - එම - | - එම - |
| (ඵ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.223,250 ක පුනරාවර්තන වියදම් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.127,879 ක වෙනසක් විය. | ඉදිරියේදි නිවැරදි කරන බව. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.9,060,964 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005 ඔක්තෝබර් 05 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 3(1) වගන්තිය | 2022 වර්ෂයේ සභා රැස්වීම් සඳහා සහභාගී නොවූ වෛද්‍ය වාර්තා ඉදිරිපත් නොකළ සභිකයින් 16 දෙනෙකු සඳහා රු.725,000 ක් ගෙවා තිබුණි. | සභා සම්මත කර ඇති බැවින් දීමනා ලබා දීමට කටයුතු කල බව. | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,863,448 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.1,575,353 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තු ආදායම, බිල්කළ ආදායම,රැස්කළ ආදායම හා හිඟ ආදායම

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්,රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බදු | 1,335,000 | 971,240 | 848,570 | 489,889 | 1,335,000 | 2,196,140 | 2,089,309 | 367,219 |
| කුලී | 6,809,400 | 4,904,386 | 6,376,431 | 355,432 | 6,859,400 | 3,143,080 | 3,203,770 | 1,827,477 |
| බලපත්‍ර ගාස්තු | 444,500 | 543,506 | 543,506 | - | 833,500 | 223,796 | 223,796 | - |
| වෙනත් ආදායම් | 8,635,000 | 9,079,007 | 14,502,202 | 736,460 | 8,424,000 | 6,831,119 | 6,886,875 | 6,159,655 |
| | 17,223,900 | 15,498,139 | 22,270,709 | 1,581,781 | 17,451,900 | 12,394,135 | 12,403,750 | 8,354,351 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක් වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුළු ආදායම රු.8,354,351 ක් වූ අතර, වර්ෂය අවසානයට එය රු.1,581,781 ක් විය. | හිඟ බදු ආදායම් අයකර ගැනීම සඳහා දැනුවත් කිරීම සිදුකර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | සභාවේ අක්කර බදු ඒකක 490 ක් පවතින අතර, ඉන් අක්කර බදු ඒකක 120 ක් පමණක් සමාලෝචිත වර්ෂය සඳහා අක්කර බදු ගෙවා තිබූ අතර, අක්කර බදු ඒකක 370 කින් රු.261,690 ක මුදලක් හිඟව පැවතුණි. | හිඟ අක්කර බදු පිළිබඳ සමීක්ෂණයක් සිදු කරමින් පවතින බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ඇ) | සභාවේ කඩ බදු ගැණුම්කරුවන් විසින් තක්සේරු වටිනාකමට වඩා වැඩි වටිනාකමකට කඩ කාමර 10 ක් අතුරු බදු දී තිබුණි. එසේ කඩ කාමර 06 ක ගිවිසුම් අළුත් කර නොතිබුණි. | තක්සේරු වටිනාකමට වැඩි වටිනාකමට පැවරීම නොකළ යුතු බව දැනුවත් කර ඇති බව හා ඉදිරියේ දී ගිවිසුම් අත්සන් කරන බව. | ගිවිසුම් හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.2,000,500 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.10,000,353 ක් ලැබිය යුතු බව දන්වා තිබුණි. | ඉදිරි කාලයේදී ලබා ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් කට්ටි කර විකිණීම් 02 ක් සඳහා සභාවේ අනුකූලතා සහතික ලබාගෙන නොතිබුණු අතර, සභාවට අයත් පොදු කොටස් ද පවරා නොතිබුණි. තවද එක් විකිණීමකින් සභාවට ලැබිය යුතු 1% බද්ද ගෙවා නොතිබුණි. | ඉඩම් කැබලි කර විකිණීම සඳහා සභාවේ අනුමැතිය ලබා දී නොමැති බව. | පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් වල වටිනාකම් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | ඔවුන්ගේ දායකත්වය ලබාදී නොමැති බව. | තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවා ගත යුතුය. |
| (ආ) | සභාව සතු වාහන 06 ක් නිශ්ක්‍රියව පැවති අතර, නැවත භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී පූර්ව අනුමැතිය මත සිදු කරන බව. | නිෂ්ක්‍රීය වත්කම් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කිරීමට රු.13,190,000ක් අනුමත කර තිබූ අතර, 2021 වර්ෂය අවසන් වන විට රු.2,505,650 ක වියදමක් දරා තිබූ නමුත්, ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි. | අවශ්‍ය මුදල අනුමත වුවහොත් ඉතිරි වැඩකොටස් අවසන් කිරීමට අපේක්ෂා කරන බව. | ඉතිරි වැඩ කොටස් ඉටු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමට කටයුතු කළ යුතුය. |